# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1961/9 - 2016 අප්‍රේල් මස 05 වැනි අඟහරුවාදා - 2016.04.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට යාපනය - කිලිනොච්චිය ජල සම්පාදන හා සනීපාරක්ෂක ව්‍යාපෘතිය යටතේ කරවෙඩ්ඩි ජල කුළුණ ඉදිකිරීමට ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දක්වෙන ඉඩම් කොටසෙහි නිශ්චල දේපල අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2016 මාර්තු මස 28 වැනි දින,
අංක 35, "ලක්දිය මැදුර",
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.
5/2/1/1180

#### උපලේඛනය

යාපනය දිස්ත්‍රික්කයේ, කරවෙඩ්ඩි ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක J/366, මතෝනි, වඩමාරච්චි, දකුණ - බටහිර ග්‍රාම නිලධාරී වසමේ කරවෙඩ්ඩි බටහිර ගමේ පිහිටි තලන්කුලි නමැති ඉඩමෙන් පර්චස් 100 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස :

| | | |
|---|---|---|
| *උතුරට* | : | එස්. තෙයිවනායි සහ තවත් අය හිමිකම් කියන ඉඩම ; |
| *නැගෙනහිරට* | : | මඩදරුමා ආතනම් හිමිකම් කියන ඉඩම ; |
| *දකුණට* | : | මඩදරුමා ආතනම් හිමිකම් කියන ඉඩම ; |
| *බටහිරට* | : | වී. සින්නාච් සහ තවත් අය හිමිකම් කියන ඉඩම. |

*ඉඩමට හිමිකම් කියන්නන්ගේ නම් සහ ලිපිනය* : 01. මනිවන්නන් රාමනී මහත්මිය
(ලිපිනය සොයාගත නොහැක)

04 - 788

1A - G 23256 — 16 (2016/04)
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

## 1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත

### 92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය, රවුෆ් හකීම් වන මම, එකී මණ්ඩලයට කුණ්ඩසාලේ - හාරගම ජල සම්පාදන ව්‍යාපෘතියේ තලාතුඔය ජල ටැංකිය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින් අත්කර ගැනීමට යෝජිත, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසෙහි නිශ්චල දේපල අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

රවුෆ් හකීම්,<br>
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය.

2016 මාර්තු මස 28 වැනි දින,<br>
අංක 35, "ලක්දිය මැදුර",<br>
නව පාර්ලිමේන්තු පාර, පැලවත්ත, බත්තරමුල්ල,<br>
නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යාංශයේ දී ය.<br>
5/2/1/1177

**උපලේඛනය**

මහනුවර දිස්ත්‍රික්කයේ, පාතහේවාහැට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 984, බුටාවත්ත උතුර ග්‍රාම නිලධාරී වසමේ කදාකුල ගමේ, නාරංකඩුව වත්ත නමැති ඉඩමෙන් සම්පූර්ණ ප්‍රමාණයෙන් පර්චස් 20 ක් පමණ වන පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස :

| | | |
|---|---|---|
| *උතුරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස ; |
| *නැගෙනහිරට* | : | තලාතුඔය - මාරස්සන ප්‍රධාන මාර්ගයේ සිට ඉඩම දක්වා වන ප්‍රවේශ මාර්ගය ; |
| *දකුණට* | : | ඩී. ඒ. පෙරේරා හිමිකම් කියන ඉඩම ; |
| *බටහිරට* | : | මෙම ඉඩමේ ඉතිරි කොටස. |

*ඉඩමට හිමිකම් කියන්නන්ගේ නම් සහ ලිපිනය* :

01. බී. ජී. වර්ෂකුලසූරිය මහතා,<br>
අංක 145, කදාකුල,<br>
තලාතුඔය.

02 ආර්. එම්. බණ්ඩාර මැණිකේ මහත්මිය,<br>
අංක 145, කදාකුල,<br>
තලාතුඔය.

04 - 789